# ගී සඳලුව
Gee... Sandaluwa



## සිසිර දිසානායක

# රුවන්වැලි සෑය



නිර්මාණකරුවකු, ශිල්පියෙකු සම්මානයෙන් අගැයීමකට ලකම්ම සැබැවින් ම ඔහුට හෝ ඇයට විශාල ධෛර්යයක්. කුමන ආයතනයකින් සංවිධානය කළ ද, අවසන එය ජනතා සම්මානයක් බවට පත් වීමයි වැදගත්ම කාරණය වන්නේ. තමන් ජනතාවට, තමන්ගේ ප්‍රජාවට දායාද කළ නිර්මාණ වෙනුවෙන් ජනතාව වෙතින් පිදෙන සම්මානයක් සැබැවින්ම නිර්මාණකරුවකුගේ හෝ ශිල්පියෙකුගේ ඉදිරිගමනට ඉතා වැදගත් වෙයි.

පසුගියදා මව් බිමේ පැවැත්වීමට යෙදුනු එක් සම්මාන උළෙලක වූ එක් විශේෂිත සම්මාන පිරිනැමීමක් යම්කිසි අපූර්වත්වයකින් යුතු වූවා. ඒ ''හිරු'' සිනමා සම්මාන උළෙලේ හොඳම ගායනය වෙනුවෙන් ප්‍රවීන ගායන ශිල්පී සුනිල් එදිරිසිංහයන්ට පිරිනැමුණු සම්මානයයි.

මෙල්බන් නුවර සංවිධානය වූ ''සඳකඩ පහණ'' සංගීත ප්‍රසංගය සඳහා සපැමිණි සුනිල් එදිරිසිංහයන්ව ''ගී සඳළුව'' වෙනුවෙන් දායක කරගැනීමට අපට අවස්ථාව ලැබුණා.

''ඇත්තටම හිරු සිනමා සම්මාන ප්‍රධානය ගැන මතක් වෙනකොට මුලින්ම කියන්න තියෙන්නේ ඒක හරි අසිරිමත් ආවර්ජනීය අවස්ථාවක් කියලයි.....'' සුනිලුන් අප හා පිළිසඳරට එක් වුනා.

''මා කොතෙකුත් සම්මාන ලබලා තියෙනවා. මේ උළෙලේවී හිරු සිනමා සම්මාන උළෙලේ සංවිධායකයින් තීරණය කරලා තිබුණා මගේම සොහොයුරු සතිස්චන්ද්‍ර එදිරිසිංහයන් සහ ජාතියේ ගායන වේදියන් අතරේ ඉහළින්ම අප සලකන නන්දා මාලනිය අතින් මේ සම්මානය මට පිරිනමන්න.''

මේ අදහස මට හරියට වටිනවා. හේතුව මම මේ ගීඨ ක්ෂේත්‍රයට පිවිසුනේ ''මාතර ආච්චි'' චිත්‍රපටය වෙනුවෙන් ''සඳකඩ පහණට කැටයම් ඔපලා'' ගීතය ගායනා කරමින්. ඉතින් ඒ ඉඩකඩ මට ලබලා දුන්නේ මගේ වැඩිමල් සොහොයුරු සතිස්චන්ද්‍ර එදිරිසිංහයන්. ඒ මුල්ම ගීතය ගැයුවේ 1973 දී. හරියටම ඊට වසර දහයකට පස්සෙයි මට මුල්ම සම්මානය ලැබුණේ. ඒ 1983 දී ''අධිෂ් ඨානය'' චිත්‍රපටයේ තේමා ගීය ගැයීම වෙනුවෙන්. හොඳම ගායනයට පිළිගන්වපු ජනාධිපති සම්මානය. ඉතින් ඒ ''අධිෂ්ඨානය'' චිත්‍රපටයත් අධ්‍යක්ෂණය කලේ මගේ සොහොයුරු සතිස්චන්ද්‍ර එදිරිසිංහයන් ම යි.

''මා පාසල් යන අවධියේ පටන් මයි විශාරද නන්දා මාලිනියගේ ගීතවලට ඇළුම් කළේ. මම කවදාවත් සිතුවේ නෑ එතුමිය අතින් සම්මානයක් ලැබෙයි කියලා. හීනෙකින්වත් හිතුවේ නෑ. ඉතින් මේ දෙදෙනා ම මා ආදරය කරන, ගෞරවකරන දෙපලක්. ඒ අය අතින් මේ සම්මානය ලැබීයමයි උළෙලේ වූ අසිරිමත් කම. ආවර්ජනීය වටිනාකම.

අපගේ ගී ක්ෂේත්‍රයේ පියවරුන් පිළිබඳව ලියැවුණු සහ සංගීතවත්ව ගැයුණු ගී ඇත්තේ කීපයක් පමණි. මෑත කාලයකදී සුනිල් එදිරිසිංහයන්ගේ ගීත එකතුවක් වන ''මල් වැහි පොද' සංගත තැටියෙහි ඇතුලත් පිය ගුණ ගීයක් වන ''රන්වැලි සෑය'' ගීය රසික ශ්‍රාවක ආදරය ලබමින් ඉස්මතුවන ගීයක් ලෙස හැඳින්විය හැකිය. සැබැවින්ම පියෙකු පිළිබඳව අප සිත්සතන්හි අප්‍රමාණ ආදරයක්, ගෞරවයක් දැනවීමට සමත් වූ ඉතා හොඳින් සමබර වූ සරු ගියකි ''රන්වැලි සෑය'' ගීය.

ඔය ගීතය රචනා කළේ පූජ්‍ය කිරඹ සුමංගල ස්වාමීන් වහන්සේයි. තනුව සහ සංගීතය මනෝරි උග්ගලගේ කියන සංගීතවේදිනියගේ. මේ නිර්මාණකරුවන් දෙපළම ළඟදී ක්ෂේත්‍රයට ආවා නමුත් ප්‍රවීණයන්ලේ නිර්මාණ කුසලතා ඇති, බොහෝ දුර ගමනක් ක්ෂේත්‍රයේ යන්න පුළුවන් අය.''

''ගීතයක් ගැයෙන්නේ තුන්වෙනි පියවර ලෙස. පළමුවෙනි පියවර වෙන්නේ ගී පද රචනය. ඉතින් රචනයේදී හොඳ සංකල්පයක් මතු වෙන්න ඕන මුලින් ම. පියගුණ, මව්ගුණ අචින්තයි. භාෂාවකි න් කියලා නිම කරන්න අමාරුයි. නමුත් භාෂාවට යන්නට බැරි දුරක් සංකල්ප රූප මවමින් යන්න පුළුවන්. ඉතින් ඒ සංකල්ප රූප භාෂාවේ තියෙන වචනලින්මයි එළි දක්වන්න වෙන්නෙත්.''

''රන්වැලි සෑය'' කියනකොටම මොනතරම් ඉහළට අපේ සිතුවිලි ගෙනියනවා ද? අප මහා ගෞතම බුදු පියාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා වැඩි ප්‍රමාණයක් තැන්පත් කරලා තියෙන පූජනීය වස්තුවක් රුවන් වැලි සෑය. ඉතින් ඒ රුවන්වැලි සෑයට අපි මේ අපේ පියාණන්ව සම කරන්නේ. යහපත් දරුවකු සමාජයට බිහි කලාම ඒ මුළු මහත් සමාජයෙන් ම වැඳුම් පිදුම් ලබනා පියෙකු හරියට රුවන් වැලි සෑය වගෙයි කියලයි මේ ව්‍යංගාර්ථයෙන් කියවෙන්නේ.''

ලෝකේ තියෙන ඉහළම ගිහි පදවියයි සක්විති රජ තනතුර. ඉතින් සිදුහත් කුමාරයාට සුද්ධෝදන රජතුමා පිළිගන්වන්න හිටියේ ඒ තනතුර. අපේ ගෙපැලේ ඉන්න පිය මහරජතුමාත් ඒ සුද්ධෝදන රජතුමා ම තමයි අපට ලබාදෙන්න තියෙන උපරිම දේ ළං කරලා දෙනවා. ඉතිං ඔය විදිහේ සරු ගීපද රචනාවකුයි මේ පද රචනාව. ඒ වගේම තමයි ඒ පද රචනාවේ තියෙන ගෞරවනීය බව, සෙනෙහස වටිනාකම අගේට ඉස්මතු වෙන විදියට මේ සංගීත නිර්මාණය වුණාත් නිම වෙලා තියෙන්නේ.''

ගායනය පිළිබඳව සුනිල් එදිරිසිංහයන් නිහඬ වුව ද පදරචනයේත් තනුවේත්, සංගීතයේත් ඇති භාවයන් ඉහලම තලයකට නංවමින් හැඟීම්බරව එදිරිසිංහයන් සිය ගැඹුරු මධුර හඬින් ගායනීයව කළ දායකත්වය වචනයෙන් ලියා දැක්විය නොහැකියි.

'සන්නස' මාසිකය වෙනුවෙන් ''සඳකඩ පහණ'' ප්‍රසංගයේ පෙරහුරුවීම් අතරේ මෙලෙස ඉඩක් වෙන්කර දීම පිළිබඳව 'ඩිරෙක්ට් ප්‍රඩක්ට්ස්' ආයතනයේ දිළුම් සහ දිමාලි ද සිල්වා යුවලට ස්තූතිවන්ත වන අතර පාඨකයින් වෙනුවෙන් අදහස් දැක්වීම වෙනුවෙන් ප්‍රවීණ ගායන ශිල්පී සුනිල් එදිරිසිංහයන්ට ද අපගේ ස්තූතිය පිරිනමමින් සුබ පැතුවෙමු.

**රන්වැලි සෑය විය දිය අඹරට නැගුණ**
**සුදොවුන් පියා විය සක්විති මඟ තනන**
**සමනල පව්ව විය දුක සැප සම කරන**
**පිය මහ රජුනි අප ගෙපැලේ රජ කරන**

**අසනි වැසි රුදුරු වග වලසුන් අතරේ**
**සිවි මහ දෙවිඳු වී නිති රැකවල් සැදුවේ**
**හිරුටත් කලින් අවදිව කෙත්වන් තැනුවේ**
**බෝසත් පාරමී ගුණයෙනි අප වැඩුවේ**

**බුදුදස් නිරිඳු සේ අත් බෙහෙතක් හදලා**
**පැල ඉනි වැටෙත් ගුණවති රූපය ඇඳලා**
**තුසිතෙක ඉසුරු පැල වට සිවි කොන තබලා**
**ලොවුතුරු සුව විඳී අප රජ වනු දැකලා**

**රචනය: පූජ්‍ය කිරඹ සුමංගල ස්වාමීන් වහන්සේ**
**තනුව සහ සංගීතය : මනෝරි උග්ගලගේ**
**ගායනය : සුනිල් එදිරිසිංහ**

සන්නස වෙළඳ දැන්වීම් / Sannasa Advrertising

**එස් ජයසිංහ / S Jayasinghe**
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**අසෝක සුබසිංහ / Asoka Subasinghe**
0432 391 922
email - sannasanews@gmail.com